# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.
☎ 011 279 7400
🖷 011 286 4051


මගේ අංකය / எனது இல / My No. LCGD/R&D/පොදු/උරුමය/2023 ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date 2023.12 . 21

චක්‍රලේඛ අංකය - 2023/01

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්
සියළුම පළාත්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්වරුන්

<u>" උරුමය වැඩසටහන"</u>

1969 අංක 16 දරණ පනතින් 1981 අංක 27 දරණ පනතින් හා 2022 අංක 11 දරණ පනතින් සංශෝධිත 1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අවසරපත්‍ර හා දීමනාපත්‍ර මත ප්‍රදානය කර ඇති ඉඩම් සංවර්ධනය කරමින් භුක්ති විඳින ගොවි ජනතාව ප්‍රමුඛ මහජනතාවට තම ඉඩමෙහි පරම අයිතිය නොමැති වීමෙන් අදාළ භූමිය මානව අවශ්‍යතා සහ සංවර්ධන අවශ්‍යතාවයන්ට යොදවා ගැනීමේ දීත් එම භූමිය ආර්ථික ඒකකයක් ලෙස සංවර්ධනය කිරීමේ දීත් විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදුව ඇත. එබැවින් එම ගැටළු අවම කර ගොවි ජනතාව ප්‍රමුඛ මහජනතාව අවසරපත්‍ර හා දීමනාපත්‍ර මත සංවර්ධනය කර භුක්ති විඳින ඉඩම්වල, පරම අයිතිය ලබා දීම පවතින නීති රාමුව තුළ ඉටුකිරීම අරමුණු කරගනිමින් එම ඉඩම්වල පරම අයිතිය ජනතාවට ප්‍රදානය කිරීම, 2024 වර්ෂයේ දී ආරම්භ කොට, වසර කිහිපයක් තුල සම්පූර්ණයෙන්ම නිම කිරීම සඳහා **"උරුමය වැඩසටහන"** නමින් යෝජනාවක් ගරු ජනාධිපතිතුමා විසින් 2024 අයවැය ලේඛනය මඟින් ඉදිරිපත් කර සම්මත කර ඇත. **"උරුමය වැඩසටහන"** 2024 වර්ෂයේ දී ආරම්භ කිරීමටත්, වසර කිහිපයක් ඇතුලත සම්පූර්ණයෙන්ම ඉටුකොට ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ප්‍රදානය කර ඇති බිම්වල පරම අයිතිය එකී ජනතාවට ලබාදීමටත් මෙමඟින් අපේක්ෂා කෙරේ.

ඒ සඳහා අංක 23/2379/615/067 හා 2023.12.06 දිනැති "ඉඩම් අවසරපත්‍රලාභීන්ට හා දීමනාපත්‍රලාභීන්ට රජයේ ඉඩම්වල පරම අයිතිය ලබා දෙන උරුමය වැඩසටහන සඳහා අනුමැතිය ලබා ගැනීම" යන මැයෙන් සංචාරක හා ඉඩම් ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023.12.11 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එම අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි **"උරුමය වැඩසටහන "** මඟින් ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ලබාදී ඇති ඉඩම් වලට කොන්දේසි සහිතව නිකුත් කර ඇති අවසරපත්‍ර සහ දීමනාපත්‍ර වෙනුවට **"උරුමය වැඩසටහන "** යටතේ 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තියට අනුකූලව නිදහස් ප්‍රදානපත්‍රයක් නිකුත් කිරීමට අදාල කටයුතු අදියර 03ක් ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

ඒ සඳහා වන ක්‍රමවේදය පැහැදිලි කිරීම හා උපදෙස් ලබාදීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. එබැවින් පහත ක්‍රමවේදයන් හා පියවරයන් අනුගමනය කරමින් **"උරුමය වැඩසටහන "** යටතේ ස්වකීය කැමැත්තෙන් අවසරපත්‍ර සහ දීමනාපත්‍ර රජයට භාරදෙන තැනැත්තන් වෙනුවෙන් නිදහස් ප්‍රදානපත්‍ර සකස් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුය.


ආයතන / நிர்வாகம் / Admin ☎ 011 279 7479 🖷 011 287 3033 | ගිණුම් / கணக்கு / Accounts ☎ 011 287 5833 🖷 011 286 4462 | ඉඩම් I / காணி I / Land I ☎ 011 287 4025 🖷 011 288 3812 | ඉඩම් II / காணி II / Land II ☎ 011 287 5834 🖷 011 287 3110 | ඉඩම් III / காணி III / Land III ☎ 011 279 7482 🖷 011 288 3635

ඊමේල් / ஈ-மெயில் E-mail - landcom@landcommdept.gov.lk    වෙබ් ලිපිනය / இணையம் Web Address - www.lancommdept.gov.lk

## 01. උරුමය ඒකකය පිහිටුවීම

දිවයිනේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල, අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල හා අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලවල උරුමය ඒකකය නමින් විශේෂිත ඒකකයක් ඉඩම් රාජකාරි ඉටු කරන මාණ්ඩලික නිලධාරියකු (සහකාර ප්‍රාදේශීය ලේකම්/ පළාත් සහකාර ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් )සහිතව අවම වශයෙන් නිලධාරීන් හතර දෙනෙකු ඇතුළත් ව පිහිටුවීමට කටයුතු කළ යුතුය.

මෙම ඒකකය මඟින් **"උරුමය වැඩසටහන"** යටතේ නිදහස් ප්‍රදානපත්‍ර ඉල්ලුම් කරන අයදුම්කරුවන්ගේ කටයුතු සම්බන්ධීකරණය, නියාමනය, ගැටළු විසඳීම හා ප්‍රදානපත්‍ර ලබාදීම දක්වා සියළු කටයුතු ඉටු කළ යුතුය.

## 02. අදියර I

ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (2) වගන්තිය යටතේ ලබාදුන් අවසරපත්‍ර සඳහා 19 (4) වගන්තිය යටතේ වන දීමනාපත්‍ර සකස් කිරීම සඳහා මේ වන විටත් e-Slims පද්ධතිය තුළින් යොමු කර ඇති අයදුම්පත් සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ පරම අයිතිය සහිත ප්‍රදානපත්‍ර 10,000ක් 2024 ජනවාරි මස අවසානයේ ලබාදීමට අපේක්ෂා කෙරේ. පළමු අදියරේදී e-Slims පද්ධතිය තුළින් දැනට ඔබ විසින් යොමු කර ඇති දීමනාපත්‍ර ඉල්ලීම් අතුරින් නිසි පරිදි සම්පූර්ණ කර ඇති අයදුම්පත් සඳහා නිදහස් ප්‍රදානපත්‍ර නිකුත් කිරීමේ කටයුතු කඩිනම් කිරීම උරුමය ඒකකයේ පළමු අදියරේ ප්‍රමුඛ කාර්යය විය යුතුය.

එකී අදියර I ට අදාළව නිදහස් ප්‍රදානපත්‍ර 10,000ක් සැකසීමේ ක්‍රමවේදය පහත පරිදි වේ.

### 2.1. උරුමය වැඩසටහන යටතේ ඉල්ලුම් කරන ලද ඉඩම් සඳහා "O" රේඛා චිත්‍ර ලබාගැනීම

e-Slims පද්ධතිය හරහා දැනටමත් ඔබ විසින් මා වෙත යොමුකර ඇති දීමනාපත්‍ර අයදුම්පත් අතරින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලේඛනය මා විසින් මැනුම්පතිට පිටපත් සහිතව ඔබ වෙත ලිඛිතව දැන්වීමට කටයුතු කරනු ලැබේ. එම අයදුම්පත් සඳහා **"උරුමය වැඩසටහන"** යටතේ පරම අයිතිය සහිත නිදහස් ප්‍රදානපත්‍ර සකස් කිරීමට "O" රේඛා චිත්‍ර අවශ්‍ය බැවින් ඒ සඳහා ආ.ඒ.ආ.118 ආකෘති මඟින් "O" රේඛා චිත්‍ර සඳහා වන, මැනුම් ඉල්ලීමක් අදාළ ප්‍රාදේශීය ලේකම් හෝ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් විසින් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යොමු කළ යුතුය. එහිදී ප්‍රදානපත්‍රලාභියාගේ නිවැරදි නම, ලිපිනය සහ e-Slims පද්ධතියේ අයදුම්පත් අංකය පැහැදිලිව ආ.ඒ.ආ.118 ආකෘතියේ සඳහන් කළ යුතුය. සෑම සතියකම සිකුරාදා දින පස්වරු 4.00ට පෙර එම සතියට අදාළව යොමු කරන ලද මැනුම් ඉල්ලීම් ලැයිස්තුවක් සමඟ අදාල මැනුම් ඉල්ලීම් වල පරිලෝකනය(scan) කරන ලද පිටපත් PDF ගොනුවක් ලෙස සකස් කර lcgdurumaya@gmail.com දරන විද්‍යුත් ලිපිනය මඟින් මා වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

එහිදී දැනට නිකුත් කර ඇති පිඹුරුවල කැබලි විස්තර ලැයිස්තුවේ සඳහන් වන්නේ, "ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දීමනාපත්‍ර නිකුත් කිරීමට" ලෙස වුවද, 2024 අයවැය ලේඛනය හා උක්ත අමාත්‍ය මණ්ඩල අනුමැතිය

පරිදි **"උරුමය වැඩසටහන"** සඳහා එකී පිඹුරුවලට අදාළව "O" රේඛා චිත්‍ර නිකුත් කිරීම මැනුම්පති විසින් සිදු කරනු ඇත. එසේම යම් අවස්ථාවක කැබලි විස්තර ලැයිස්තුවේ සඳහන් ඉල්ලුම්කරුගේ නාමෙහි වෙනසක් තිබේනම් මෙම පළමු අදියරේදී නිදහස් ප්‍රදානපත්‍ර සකස් කරනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් / අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් විසින් නිසි ක්ෂේත්‍ර පරීක්ෂාවක් හා ලේඛන පරීක්ෂාවකින් පසුව e-Slims පද්ධතිය හරහා යොමුකර ඇති දීමනාපත්‍ර අයදුම්පත් සඳහා වන බැවින් මැනුම්පති විසින් නැවත ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීමෙන් තොරව "O" රේඛා චිත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ හැකිය.

තවද අනුබෙදුම් කර නිරවුල්ව භුක්ති විඳින ඉඩම් සඳහා නිදහස් ප්‍රදානපත්‍ර ඉල්ලුම් කරන අවස්ථාවලදී වහාම මැනුම් ඉල්ලීමක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය. ඒ අනුව අනු බෙදුම් ඉඩම් කැබලි සඳහා අවශ්‍ය නිර්දේශ වාර්තා ප්‍රාදේශීය ලේකම් විසින් / අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/ පළාත් ඉඩම් කොමසාරිස් මගින් මා වෙත වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතුය.

## 2.2. ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසරපත්‍ර භාර ගැනීම

මෙම වැඩසටහනේ අදියර I යටතේ නිදහස් ප්‍රදානපත්‍ර සකස් කිරීම සඳහා 2.1 ඡේදයෙහි සඳහන් පරිදි ආ.ඒ.ආ.118 අනුව මැනුම් ඉල්ලීම් යොමු කරන ලද ඉඩම්වලට අදාළ අවසරපත්‍රකරු/ නීත්‍යානුකූල උරුමකරු විසින් අවසරපත්‍රය ස්වකීය කැමැත්තෙන් රජයට භාරදෙන අවස්ථාවේදී භාරගැනීමට කටයුතු කළ යුතුය.

ඒ සඳහා මෙම චක්‍රලේඛයේ ඇමුණුම 01 පිටපත් දෙකකින්(02) සකස් කළ යුතුය. ඉන් එක් පිටපතක් වෙනම ගොනුකර අනෙක් පිටපත ඉල්ලුම්කරු වෙත භාරදීමට කටයුතු කළ යුතුය.

ඉන් අනතුරුව ලෙජරයේ **"උරුමය වැඩසටහන යටතේ පරම අයිතිය ඇති නිදහස් ප්‍රදානපත්‍රයක් ලබා ගැනීමට ස්වකීය කැමැත්තෙන් රජයට භාරදෙන ලද අවසරපත්‍රයකි."** ලෙස අවසරපත්‍රයේ හා ලෙජරයේ සටහනක් යෙදිය යුතුය. එයට අදාළව නිදහස් ප්‍රදානපත්‍රය සකසා ලියාපදිංචි කර ප්‍රදානපත්‍රලාභියාට භාරදුන් පසුව නිදහස් ප්‍රදානපත්‍රයේ අංකය ලෙජර් පිටුවේ සටහන් කර ප්‍රාදේශීය ලේකම්/සහකාර ප්‍රාදේශීය ලේකම් හෝ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්ගේ අත්සන සහ නිල මුද්‍රාව සහිතව ලෙජර් පිටුව අවලංගු කිරීමට කටයුතු කළ යුතුය.

## 2.3. පළමු අදියරේ නිදහස් ප්‍රදානපත්‍ර සකස් කිරීම, ලියාපදිංචි කිරීම සහ නිකුත් කිරීම

ඉහත 2.1 හි දක්වා ඇති පරිදි ආ.ඒ.ආ. 118 ආකෘතියෙන් මැනුම් ඉල්ලීම් යැවීමෙන් අනතුරුව මැනුම්පති විසින් එයට අදාල "O" රේඛා චිත්‍රය මා වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත. ඉන්පසුව අදාළ ඉඩම් කැබැල්ල සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ නිදහස් ප්‍රදානපත්‍රයක් මා විසින් සකස් කර ඉඩම් විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් මඟින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 23(2) වගන්තිය අනුව ජනාධිපති ලේකම් විසින් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූප අත්සන සහ රාජ්‍ය මුද්‍රාව පිහිටුවා නිදහස් ප්‍රදානපත්‍රය මා වෙත යොමු කිරීමෙන් අනතුරුව ඉඩම්

රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් හෝ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් වෙත මා විසින් යොමු කරනු ලැබේ.

පළමු අදියරට අදාළ නිදහස් ප්‍රදානපත්‍ර 10,000 ලියාපදිංචි කිරීම සඳහා කඩිනමින් ක්‍රියා කළ යුතු අතර ඒ සඳහා මෙම චක්‍රලේඛයේ **ඇමුණුම 03** ආකෘතිය භාවිතා කරමින් ලියාපදිංචි කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය. මෙම කටයුතු 2024 ජනවාරි මස අවසන් සතිය වන විට අවසන් කළ යුතු අතර 2024 පෙබරවාරි මස 2 දින වන විට සියළු නිදහස් ප්‍රදානපත්‍ර ලියාපදිංචි කර ප්‍රාදේශීය ලේකම් හෝ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

අදියර Iට අදාළව නිදහස් ප්‍රදානපත්‍ර, ප්‍රදානපත්‍රලාභීන් වෙත නිකුත් කිරීම පිළිබඳ උපදෙස් ඔබ වෙත ඉදිරියේ දී ලබා දීමට කටයුතු කරනු ලැබේ.

## 03. අදියර II

උරුමය වැඩසටහනට අදාලව අදියර I අවසන් වූ වහාම අදියර II ආරම්භ වේ. (අදියර II ආරම්භ කළ යුතු කාලවකවානුව හා අදියර II ට අදාළ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් ඉදිරියේ දී දැනුම් දීමට කටයුතු කරනු ඇත) ඒ අනුව ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ නිකුත් කළ අවසරපත්‍ර හා 19 (4) වගන්තිය යටතේ නිකුත් කළ දීමනාපත්‍ර අතුරින් ලබාදුන් අරමුණට අනුව සංවර්ධනය කර ගැටළු රහිතව නිරවුල්ව භුක්ති විඳින අවසරපත්‍රලාභීන්/දීමනාපත්‍රලාභීන් හෝ නීත්‍යානුකූල හිමිකරුවන් විසින් ස්වකීය කැමැත්තෙන් තම අවසරපත්‍රය/දීමනාපත්‍රය රජයට භාරදී "උරුමය වැඩසටහන" මඟින් පරම අයිතිය සහිත නිදහස් ප්‍රදානපත්‍රයක් ලබාගැනීමට ඉල්ලා සිටින අවස්ථාවක දී ඔවුන් සඳහා මෙම අදියර යටතේ නිදහස් ප්‍රදානපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ඒ සඳහා පහත ක්‍රමවේදය පරිදි ක්‍රියාකළ යුතුය.

### 3.1. ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) අවසරපත්‍ර / 19(4) දීමනාපත්‍ර භාර ගැනීම

ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ ලබා දී ඇති අවසරපත්‍ර රජයට භාර ගැනීම සඳහා මෙම චක්‍රලේඛයේ **ඇමුණුම 01** ආකෘතිය භාවිතා කළ යුතුය. එය පිටපත් දෙකක් සහිතව භාර ගැනීමට කටයුතු කළ යුතු අතර මුල් පිටපත පරිලෝකනය(scan) කර e-Slims පද්ධතියට ඇතුලත් කර ඉල්ලුම්කරු වෙත භාරදීමටත් අනෙක් පිටපත ගොනු කර තැබීමටත් කටයුතු කළ යුතුය.

ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වගන්තිය යටතේ ලබා දී ඇති දීමනාපත්‍ර රජයට භාර ගැනීමට මෙම චක්‍රලේඛයේ **ඇමුණුම 02** ආකෘතිය භාවිතා කළ යුතුය. එය පිටපත් තුනකින්(03) සකස් කළ යුතු අතර එක් පිටපතක් පරිලෝකනය(scan) කර e-Slims පද්ධතියට ඇතුල් කර දෑඝ පිටපත වෙනම ගොනුකර තැබිය යුතුය.

ඉතිරි පිටපත් දෙකෙන් එක් පිටපතක් ඉල්ලුම්කරු වෙත භාරදීමටත් අනෙක් පිටපත ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමටත් කටයුතු කළ යුතුය.

### 3.2. සුදුසුකම් ලැබූ අවසරපත්‍ර / දීමනාපත්‍ර සඳහා "O" රේඛා චිත්‍ර ලබාගැනීම

එසේ භාරගන්නා ලද අවසරපත්‍ර/දීමනාපත්‍ර සඳහා උරුමය වැඩසටහන අනුව පරම අයිතිය ඇති නිදහස් ප්‍රදානපත්‍ර පිළියෙල කිරීමට " O " රේඛා චිත්‍ර සකස් කිරීම සඳහා වන, ආ.ඒ.ආ.118 ආකෘති මගින් මැනුම් ඉල්ලීමක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යොමු කර එම ඉල්ලීමේ පිටපතක් e-Slims පද්ධතිය වෙත ඇතුලත් කළ යුතුය. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් "O" රේඛා චිත්‍ර මා වෙත එවීමට කටයුතු කරනු ඇත.

### 3.3. e-Slims පද්ධතිය මගින් අයදුම්පත යොමු කිරීම

ඉහත 3.1 පරිදි ස්වකීය කැමැත්තෙන් රජයට භාරදෙන ලද ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ ලබා දී ඇති අවසරපත්‍රයේ තොරතුරු e-Slims පද්ධතියට ඇතුලත් කර ප්‍රාදේශීය ලේකම් නිර්දේශ කිරීමෙන් පසු පළාත් ඉඩම් කොමසාරිස්, අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් මගින් මා වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

ස්වකීය කැමැත්තෙන් රජයට භාරදෙන ලද ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වගන්තිය යටතේ ලබා දී ඇති දීමනාපත්‍ර සඳහා මෙම වැඩසටහන යටතේ කටයුතු කිරීමට e-Slims පද්ධතිය මගින් ඉහත 3.1 සහ 3.2 හි දැක්වූ පරිදි තොරතුරු හා ඇමුණුම් ඇතුළත් කර ප්‍රාදේශීය ලේකම් නිර්දේශ කිරීමෙන් පසු පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් මගින් මා වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය. (ඒ සඳහා හඳුන්වා දී ඇති නව e-Slims යොමුව සම්බන්ධයෙන් ඉදිරියේ දී ඔබ වෙත දැනුම් දීමට කටයුතු කරනු ලැබේ)

### 04. රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ පරම අයිතිය ඇති නිදහස් ප්‍රදානපත්‍ර සකස් කිරීම

ඉහත 3.3 අනුව ඔබ විසින් යොමු කරන ලද ප්‍රදානපත්‍ර ඉල්ලුම්පත් සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ පරම අයිතිය ඇති නිදහස් ප්‍රදානපත්‍රය මා විසින් සකස් කර ඉඩම් විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් මගින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 23(2) වගන්තිය අනුව ජනාධිපති ලේකම් විසින් ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූප අත්සන සහ රාජ්‍ය මුද්‍රාව පිහිටුවා නිදහස් ප්‍රදානපත්‍රය මා වෙත යොමු කිරීමෙන් අනතුරුව මා විසින් ප්‍රාදේශීය ලේකම් හෝ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් වෙත යොමු කරනු ලැබේ.

## 05. නිදහස් ප්‍රදානපත්‍රය ලියාපදිංචි කිරීම

මා විසින් ප්‍රාදේශීය ලේකම් හෝ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් වෙත යොමු කරනු ලැබූ නිදහස් ප්‍රදානපත්‍ර මෙම චක්‍රලේඛයේ ඇමුණුම **03** භාවිතා කරමින් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ  ලියාපදිංචි කිරීම සඳහා යොමු කළ යුතුය.  එහිදී ප්‍රදානපත්‍රය නිකුත් කරනු ලබන්නේ පෙර ලියාපදිංචිය සහිත දීමනාපත්‍රයක් සඳහා නම් එම දීමනාපත්‍ර අංකය හා පෙර ලියාපදිංචි විස්තර උක්ත ඇමුණුම **03** ආකෘතියේ නිවැරදිව සඳහන් කිරීමට කටයුතු කළ යුතුය.

## 06. අදියර III

ඉහත අදියර I හා අදියර II සඳහා සුදුසුකම් නොලැබූ අවසරපත්‍රලාභීන්/ප්‍රදානපත්‍රලාභීන් සඳහා උරුමය වැඩසටහන යටතේ නිදහස් ප්‍රදානපත්‍ර ලබා දීම මෙම අදියරේ දී සිදු කරනු ලැබේ. මෙම අදියර, අදියර II ට සමගාමීව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.

### 6.1. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබා දී ඇති අවසරපත්‍ර/දීමනාපත්‍ර ඉඩම්වලට අදාළ ගැටළු නිරාකරණය කිරීම

ඒ අනුව ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ වන අවසරපත්‍ර හා 19 (4) වගන්තිය යටතේ වන දීමනාපත්‍ර  අතරින් අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන නොමැති දීමනාපත්‍ර ඉඩම් වල පසු කටයුතු සම්බන්ධව මතුවී ඇති ගැටලු විසඳීමට හා ඉඩම්වල ආරවුල් තත්ත්වයන් විසඳීමට ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් කටයුතු කළ යුතුය. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්/පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් විසින් කටයුතු කර උරුමය ඒකකය වෙත යොමු කළ යුතුය.

පරම අයිතිය ඇති නිදහස් ප්‍රදානපත්‍ර ලබා දීම මගින්, ජනතාවට සිය ඉඩමේ උරුමය ලබා දීම රජයේ ප්‍රමුඛ ප්‍රතිපත්තිය සාක්ෂාත් කර ගැනීම, ඔබගේ ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු කිරීමට වගබලා ගතයුතුය.

### 6.2. රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ පරම අයිතිය සහිත නිදහස් ප්‍රදානපත්‍ර සකස් කිරීම

ඉහත 6.1 අනුව හඳුනා ගත් ගැටළු නිරවුල් කිරීමෙන් අනතුරුව,  සුදුසුකම් ලබන අවරපත්‍ර ලාභීන් හා දීමනාපත්‍ර ලාභීන් ස්වකීය කැමැත්තෙන් තම අවසරපත්‍රය/ දීමනාපත්‍රය රජයට භාරදී  **"උරුමය වැඩසටහන"** මගින් පරම අයිතිය සහිත නිදහස් ප්‍රදානපත්‍ර ලබාගැනීමට ඉල්ලා සිටින අවස්ථාවක, ඉහත අදියර II ට අදාළ ක්‍රමවේදය අනුගමනය කරමින් රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ පරම අයිතිය සහිත ප්‍රදානපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතුය.

**07.** උරුමය වැඩසටහන යටතේ ලබා දෙන ප්‍රදානපත්‍රවල ලේඛනයක් පවත්වා ගැනීම

උරුමය වැඩසටහන යටතේ මහජනතාව වෙත ප්‍රදානය කරනු ලබන සෑම නිදහස් ප්‍රදානපත්‍රයකම තොරතුරු ලේඛනයක් පහත ආකෘතිය අනුව ඔබගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් යාවත්කාලීනව පවත්වා ගත යුතුය. සෑම කාර්තුවකම අවසානයේ ඔබ විසින් යාවත්කාලීන කරන ලද ලේඛනයේ පිටපතක් මා වෙත විද්‍යුත් තැපැල මඟින් යොමු කිරීමට කටයුතු කළ යුතුය.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රදානපත්‍ර ලාභියාගේ නම | පිඹුරු අංකය | කැබලි අංකය | ඉඩමේ ප්‍රමාණය (හෙක්.) | උරුමය වැඩසටහන සඳහා තෝරාගැනීමට පදනම් වූ අවසරපත්‍රය/ දීමනාපත්‍ර අංකය | නිදහස් ප්‍රදානපත්‍ර අංකය | පත්ඉරු අංකය | නිදහස් ප්‍රදානපත්‍රය නිකුත් කළ දිනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |

ඉහත ක්‍රමවේදයන් අනුගමනය කරමින් **“උරුමය වැඩසටහන”** සාර්ථක කර ගැනීම සඳහා ඔබ ඇතුලු කාර්යය මණ්ඩලයේ ප්‍රමුඛ දායකත්වය අපේක්ෂා කරන අතර මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වුවහොත් පහත සන්නිවේදන ආකාර මඟින් විමසීමට කටයුතු කරන මෙන් දන්වමි.

දුරකථන අංක : 0112878982 / 0112883812

ෆැක්ස් අංක : 0112864051

විද්‍යුත් තැපැල : lcgdurumaya@gmail.com

මෙම චක්‍රලේඛය ජනාධිපති ලේකම් කාර්යාලය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ එකඟතාවය මත නිකුත් කරන ලදි.

කේ.ඩී. බන්ධුල ජයසිංහ

ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්:

1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
3. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
4. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
5. ලේකම්, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
6. ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය
7. ලේකම්, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
8. ලේකම්, පරිසර අමාත්‍යාංශය
9. ලේකම්, කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
10. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
11. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
12. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
13. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
14. මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව
15. කොමසාරිස් ජනරාල්, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
16. රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
17. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව
18. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
19. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
20. අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
21. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
22. සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
23. සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය
24. සභාපති, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
25. සභාපති, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
26. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
27. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය

(1–26) කරු.දැ.ගැ.ස සහ අ.ක.ස

ඇමුණුම 01

**1969 අංක 16 දරන පනතින්, 1981 අංක 27 දරණ පනතින් හා 2022 අංක 11 දරණ පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (2) වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසරපත්‍රයක් උරුමය වැඩසටහන යටතේ නිදහස් ප්‍රදානපත්‍රයක් ලබා ගැනීමේ එකඟතාවය මත රජයට භාරදීම**

.................................................................. පළාතේ ........................................................දිස්ත්‍රික්කයේ, ........................................................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ........................................................ග්‍රාම නිලධාරී වසමේ, ........................................................................................................................................ ලිපිනයේ පදිංචි ..............................................................................................................................වන මම,

(අවසරපත්‍රකරුගේ නම)

මා වෙත ලැබී ඇති .............................................අංක දරණ අවසරපත්‍රයේ සඳහන් කොන්දේසි ඉවත් කර 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ නිදහස් ප්‍රදානපත්‍රයක් ලබා ගැනීමේ එකඟතාවය මත අද දින එකී ....................................... අංක දරණ අවසරපත්‍රය ස්වකීය කැමැත්තෙන් ආපසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට භාරදෙමි.

අවසරපත්‍රකරුගේ අත්සන :- ................................................

ජාතික හැඳුනුම්පත් අංකය :- ................................................

දිනය:-............................................

ඉහත කී අවසරපත්‍රය අද දින භාර ගනිමි.

........................................................

ප්‍රාදේශීය ලේකම්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/

අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්

එකී ඉඩමේ උපලේඛණය

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

| අවසරපත්‍ර අංකය | නිකුත් කළ දිනය | ලෙජර් අංකය හා පිටු අංකය |
|---|---|---|
| .................................. | .............................. | ................................ |

ඇමුණුම 02

මගේ අංකය - ..............................................
දෙදහස්................................මස.................දින,
...................................... කාර්යාලයේ දිය.

දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්,

....................................

**1969 අංක 16 දරන පනතින්, 1981 අංක 27 දරණ පනතින් හා 2022 අංක 11 දරණ පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) වගන්තිය යටතේ නිකුත් කරන ලද දීමනාපත්‍රය උරුමය වැඩසටහන යටතේ නිදහස් ප්‍රදානපත්‍රයක් ලබා ගැනීමේ එකඟතාවය මත රජයට භාරදීම ලියාපදිංචි කිරීම**

...............................................................පළාතේ.......................................................දිස්ත්‍රික්කයේ,
....................................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, .......................................................ග්‍රාම නිලධාරි වසමේ, ..........................................................................................................................................
ලිපිනයේ පදිංචි ......................................................................................................................................... වන මම
(දීමනාපත්‍රකරුගේ නම)
මා වෙත ලැබී ඇති ........................................අංක දරන දීමනාපත්‍රයේ සඳහන් කොන්දේසි ඉවත් කර 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ නිදහස් ප්‍රදානපත්‍රයක් ලබා ගැනීමේ එකඟතාවය මත අද දින එකී ...................................... අංක දරන දීමනාපත්‍රය ස්වකීය කැමැත්තෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට භාරදෙමි.

දීමනාපත්‍රකරුගේ අත්සන :- ....................................

ජාතික හැඳුනුම්පත් අංකය :- ....................................

ඉහත කී දීමනාපත්‍රය අද දින භාර ගනිමි.

...........................................................

ප්‍රාදේශීය ලේකම්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/

අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්

එකී ඉඩමේ උපලේඛණය

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

| දීමනාපත්‍ර අංකය | පෙර ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය |
|---|---|---|
| .................................. | .................................. | .................................. |

ඇමුණුම 03

මගේ අංකය - ..............................................
දෙදහස්..............................මස................දින,
...................................... කාර්යාලයේ දීය.

දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්,

.....................................

1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ ලබා දෙන ලද නිදහස් ප්‍රදානපත්‍රය ලියාපදිංචි කිරීම

මෙහි පහත දැක්වෙන උපලේඛණයෙහි සඳහන් ඉඩම් කොටස සඳහා "උරුමය වැඩසටහන" යටතේ 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ ...............................අංක දරන නිදහස් ප්‍රදානපත්‍රය .......................................................................................................................................... ලිපිනයෙහි පදිංචි .................................................................................. (නම) යන අය වෙත ................................ දිනැතිව ලබා දී ඇති බැවින් මෙම ඉඩම ලියාපදිංචි කිරීමට කටයුතු කරන්න.

උපලේඛණය

(රේඛා චිත්‍ර අංකය O/....../............)

.................................... පළාතේ .......................................... දිස්ත්‍රික්කයේ ............................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ .................................... ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ................................... යන ගමෙහි පහත දැක්වෙන මායිම් ඇතුළත පිහිටියා වූ ද අංක .................................... වැනි ක්ෂේත්‍ර පත්‍රයෙහි ...........................................දරන පිඹුරෙහි කැබලි අංක ............................. වශයෙන් පෙන්වා ඇති හෙක්ටයාර්...........................................................................................(හෙක්. .............................) විශාල ..................................නම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අයත් ඉඩම් කොටස වේ.

එකී මායිම් -

උතුරට :

නැගෙනහිරට :

දකුණට :

බටහිරට :

---

පෙර ලියාපදිංචි කර ඇත/නැත

පෙර ලියාපදිංචි කර තිබේනම්,

උක්ත උපලේඛණයේ දැක්වෙන ඉඩම පහත දැක්වෙන දීමනාපත්‍ර අංකය මඟින් පෙර ලියාපදිංචි කර ඇති අතර එම ලියාපදිංචිය අවලංගු කිරීමට ද කටයුතු කරන්න.

| දීමනාපත්‍ර අංකය | පෙර ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය |
|---|---|---|
| ................................. | .................................. | ................................ |

.........................................................

ප්‍රාදේශීය ලේකම්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්